# නිල් සුරංගනාවි සහ රෝස සුරංගනාවි



සනුති තසන්‍යා පීරිස්

# නිල් සුරංගනාවි
# සහ
# රෝස සුරංගනාවි

කතාව සහ චිත්‍ර

සනුති තසනායා පීරිස්

# නිල් සුරංගනාවි
# සහ
# රෝස සුරංගනාවි

**සනුති තසනා්‍යා පීරිස්ගේ**
**පළමු දිග හැරීමයි**

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

ඉගෙනුම ලබන පන්තිය : 3 ශ්‍රේණිය D

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN 978-624-211-1001

# පිදුම

ආදරණීය

මහාමායා විදුහල්

මාතාවට

මේ පොත

හදපිරි සතුටින් තිළිණ

කරමි.....



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

නිල් සුරංගනාවි හරි හොඳයි. රෝස සුරංගනාවි සහ නිල් සුරංගනාවි හොඳ යාළුවෝ. ඉතින් ඒ දෙන්නා කැලේට ගියා. කැලේ හිටිය මායාකාරිය නිල් සුරංගනාවිට විස බෙහෙතක් දුන්නා. නිල් සුරංගනාවිට සිහිය නැති වුණා. රෝස සුරංගනාවි පියාඹලා ගියා. දේදුනු රැජිනට රෝස සුරංගනාවි කිව්වා.



දේදුනු රජින පියාඹලා නිල් සුරංගනාවි ළඟට ගියා. දේදුනු රජින මැජික් වලින් නිල් සුරංගනාවිව හොඳ කලා. ඒත් එයාට මොනවත් මතක නෑ. දේදූනු රජින දූකලා මායාකාරිය පැනලා ගියා. හැම සුරංගනාවියක්ම ආවා. රතු, තැඹිලි, කහ, කොළ, දම්, රත්තරන්, රිදී, කළු, අළු, සුදු, මෙරූන්, දුඹුරු, සුරංගනාවියෝ. සුරංගනාවියෝ ආසම කෑම මැජික් පලතුරු.

ඉතින් මේ සුරංගනාවියෝ නිල් සුරංගනාවිට මැජික් පලතුරු දුන්නා. ඒත් නිල් සුරංගනාවිට මතක නෑ. එතකොට දේදුනු රැජින කිව්වා "අපිට දන් එක ක්‍රමයයි ඉතුරු වෙලා තියෙන්නේ. අපි කණ්ඩායම් 3 කට බෙදෙන්න ඕනෙ.



එතකොට කළු සුරංගනාවි ඔයා නිල් සුරංගනාවිත් එක්ක ඉන්න. අනිත් සුරංගනාවියෝ කණ්ඩායම් 3 කට දූන් මම බෙදනවා. රතු, තැඹිලි, කහ, කොළ සුරංගනාවියෝ පළමුවෙනි කණ්ඩායමයි. අළු, සුදු, මෙරූන් දෙවන කණ්ඩායමයි. දම්, රිදී, රත්තරන්, රෝස සුරංගනාවියෝ තුන් වෙනි කණ්ඩායමයි. "මමත් එනවා තුන්වෙනි කණ්ඩායමත් එක්ක යන්න" දේදුනු රැජින කිවුවා.

දැන් පළමු වෙනි කණ්ඩායම මෙහෙට එන්න. ඔයගොල්ලන්ට තියෙන්නේ සර්ප ගුහාවේ ඇතුලේ තියෙන පලිගුව අරගෙන එන්න. හැබැයි ඔයගොල්ලන් පරිස්සම් වෙන්න ඕනි. ඇයි දන්නවද? ඒ සර්ප ගුහාව ඉදිරියේ මායා සර්පයොත් ඉන්නවා. ඔයගොල්ලන් ඒ මැජික් පලතුරු සර්පයන්ට දෙන්න. දැන් දෙවෙනි කණ්ඩායම එන්න. ඔයගොල්ලන්ට තියෙන්නේ කැරකෙන ගෙදර තියෙන අරුම පුදුම දියරය අරන් එන්න.





හැබැයි ඒ ගෙදර යතුර තියෙන්නේ ගිනි මකරා ළඟයි. ඔයගොල්ලන් මකරට ඔහු ආසම චෙරි ලබා දෙන්න. ඉන් පසුව යතුර ඉල්ලා ගන්න. ඉන්පසු ගෙදර අගුලට යතුර දමා දොර අරින්න. ඉන්පසු අරුැම පුදුම දියරය රැගෙන එන්න. දැන් තුන්වෙනි කණ්ඩායම එන්න. ඔයගොල්ලන්ට තියෙන්නේ රත්තරන් සිංහයාගේ රන් ලෝමයක් අරගෙන එන්න. මමත් එනවා තුන්වෙනි කණ්ඩායමත් එක්ක. දේදුනු රැජින කිවුවා. දැන් කණ්ඩායම් තුනම පිටත් වෙන්න.

පළවෙනි කණ්ඩායම සර්ප ගුහාව ළඟට ගියා. පළවෙනි කණ්ඩායමේ සුරංගනාවියෝ මැජික් පලතුරු සර්පයින්ට දීලා ඒගොල්ලන් ඇතුළට ගියා. සුරංගනාවියෝ මායා විදුලි පන්දම් අරගෙන ඇතුළට ගියා. ඒගොල්ලන්ට පළිඟුව හම්බ වුණා. ඒ පළිඟුව රතු සුරංගනාවි ගත්තා. ඊට පස්සේ ඒගොල්ලන් ගියා. දූන් දෙවෙනි කණ්ඩායම. දෙවෙනි කණ්ඩායමේ අයත් කැරකෙන ගෙදර ළඟට ගියා.





එතකොට ඒගොල්ලන්ට මතක් වුණා දේදුනු රැජින කිවුව දේ. සුරංගනාවියෝ මකරා ළඟට ගියා. අළු සුරංගනාවි මකරාට චෙරි දුන්නා. මෙරුන් සුරංගනාවි යතුර රැගෙන කැරකෙන ගෙදර දොරේ අගුල ඇරියා. දුඹුරු සුරංගනාවි අරුම පුදුම දියරය අරගෙන ගියා.



තුන්වෙනි කණ්ඩායම රත්තරන් සිංහයා ළඟට ගියා. දේදුනු රැජින ඇහුවා සිංහයාගෙන් "අපිට ඔබගේ ලෝමය දෙන්න පුළුවන්ද?" සිංහයා දැනගත්තා ඒ ඉන්නේ දේදුනු රැජින බව.



දේදුනු රැජිනට ලෝමයක් දුන්නා. ඉන් පසු හැමෝම නිල් සුරංගනාවි ළඟට ආවා. හැමෝම එකතු වෙලා බෙහෙත හැදුවා. නිල් සුරංගනාවිට පෙවුවා. නිල් සුරංගනාවිට මතකය ආවා. සිදු වූ හැම දෙයක්ම නිල් සුරංගනාවිට කිවුවා. නිල් සුරංගනාවි හැම සුරංගනාවියකටම ස්තූති කළා. හැමෝටම සතුටුයි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-1001